**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය )**
**අදියර - 01 - 2014**

-----------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) අදියර 01 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) සමඟ 2001 පෙබරවාරි 20 දින එළඹි කොළඹ නගරයේ පිටත වටරවුම් මහා මාර්ග පිළිබඳ විස්තරාත්මක සැළසුම් අධ්‍යයනය සඳහා වූ ගිවිසුම යටතේ ලැබුණු ජපන් යෙන් මිලියන 580 කට සමාන රු.මිලියන 417ක ප්‍රදානයකින් ආරම්භ කර තිබුණි. තවද, කොට්ටාව සිට කඩුවෙල අදියර I දක්වා වූ කි.මී 11 ක අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා 2007 මාර්තු 28 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ පෙර පැවති ජාත්‍යන්තර සහයෝගිතාවය පිළිබඳ ජපන් බැංකුව (ජාසජබැ) සමඟ අංක එස්එල් - පී89 දරන ණය ගිවිසුමට එළඹ තිබුණි. පසුව කඩුවෙල සිට කඩවත අදියර II දක්වා කි.මී. 8.9 ක අධිවේගී මාර්ගය ඉදිකිරීමට 2008 ජූලි 29 වන දින හා 2011 මාර්තු 22 දින පිළිවෙළින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය සමඟ අංක එස්එල් - පී91 හා එස්එල් - පී 101 දරන දෙවන ගිවිසුම් වලට එළඹ තිබුණි. කඩවත සිට කෙරවලපිටිය දක්වා කි.මී.9.32 අධිවේගී මාර්ගය ව්‍යාපෘති අදියර III යටතේ ඉදිකිරීමට 2014 සැප්තැම්බර් 16 දින ශ්‍රී ලංකා රජය හා චීන එක්සිම් බැංකුව වෙනම ණය ගිවිසුමකට එළඹ තිබුණි.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------

ව්‍යාපෘති ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ විශ්ව විද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ,

(අ) කොළඹ මහ නගර සහා ප්‍රදේශය තුළ ප්‍රවාහන තදබදය අවම කිරීම හා ඒ අනුව මුළු රටෙහිම සම්බන්ධතාවයන් වැඩිදියුණු වන පරිදි දක්ෂිණ අධිවේගී මාර්ගය හා කොළඹ නගරය කේන්ද්‍ර කර දිවෙන වෙනත් ජාතික මාර්ග සම්බන්ධ වන ආකාරයට කොළඹ අවට අධිවේගී මාර්ගයක් ඉදිකිරීම.

(ආ) කොළඹ නාගරික කලාපයේ ප්‍රවාහන තදබදය අවම කිරීම සඳහා කොළඹ කේන්ද්‍ර කොට දිවෙන ප්‍රධාන මාර්ගය හා දකුණු අධිවේගී මාර්ගය සම්බන්ධ වන අධිවේග මාර්ග ඉදිකිරීම තුළින් ශ්‍රී ලංකාවේ වෙනත් පළාත් අතර ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීමට දායකත්වයක් සැපයීම.

ව්‍යාපෘතියේ අදියර I හා අදියර II සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 72,924 ක් වූ අතර ඉන් රු. මිලියන 52,007 සමාන ජපාන යෙන් මිලියන 46,974 ක් මූල්‍යනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ නියෝජිතායතනය එකඟවී තිබුණි.

අධිවේගී මාර්ගයේ අදියර I ඉදිකිරීම 2008 මැයි මාසයේ ආරම්භ කිරීමට නියමිත වූ අතර මාස 48 ක් තුළ 2012 අප්‍රේල් මාසය වන විට සම්පූර්ණ කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතු 2009 ඔක්තෝබර් 22 දින කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබුණු අතර මාස 42 ඇතුළත මාර්ගය කි.මී 11 ක් වසර 2013 නිම කිරීමට බලාපොරොත්තු විය. තවද, ව්‍යාපෘතියේ 11 වන අදියර මාර්ග ඉදිකිරීම් කටයුතු 2009 ඔක්තෝබර් 22 දින වෙනත් කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර තිබුණු අතර මාස 36 ක් ඇතුළත එනම් 2013 දෙසැම්බර් 23 දින වන විට නිම කිරීමට අපේක්ෂිත විය. මාර්ග සංවර්ධන අධිකාරියේ ඉල්ලීම මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2012 අප්‍රේල් 25 දිනැති ලිපියට අනුව ව්‍යාපෘතියේ අදියර II වෙනත් ව්‍යාපෘති නියාමන ඒකකයක් සේ සලකා ඒ යටතේ 2011 සැප්තැම්බර් 05 දින සිට වෙනමම මෙහෙයවා තිබුණි. අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට කඩුවෙල දක්වා වූ කොටස නිමකොට 2014 මාර්තු 08 දින රථවාහන ගමනාගමනයට විවෘත කරන ලදි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරනයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මවිසින් ලබා ගෙන ඇති

විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත් , වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන වැඩිමනත් මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැඟීමට පත්වන පරිදි සැසඳීම කර තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

## 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායන ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අතුරු ගෙවීම් සහතිකයේ දක්වා තිබූ රු.23,309,323,443 ක කළ වැඩ වටිනාකම ඊට අනුරූපී ලෙජර් ගිණුමේ රු.23,309,776,693 ක් ලෙස සාවද්‍ය ලෙස පෙන්නුම් කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අදියර 111 යටතේ සිදුරු කිරීමේ පරීක්ෂණ කටයුතු සඳහා වැය කළ රු.3,146,672 ක් පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ අදියර 111 ට මාරු කිරීම වෙනුවට ව්‍යාපෘතියේ අදියර 1 ට අයකර තිබුණි. තවද අදියර 11 සමාලෝචිත වර්ෂයට අදාලව සිදු කළ උපදේශක ගාස්තු රු.94,947,010 ක් වැරදි සහගත ලෙස ව්‍යාපෘතියේ පිටත වටරවුම් මාර්ගයේ අදියර 1ට අය කර තිබුණි.

### 2.2.2 නොසැඳු ශේෂයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය ලෙස රු.3,213,304 ක් දක්වා තිබුණි. කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරිය ඊට අදාලව පවත්වාගෙන යනු ලැබූ ජංගම ගිණුමේ එම දිනට ව්‍යාපෘතියෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු.432,411 ක් පමණක් දක්වා තිබුණි. රු.2,780,893 ක වෙනසට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අදියර 1 හා අදියර 11 අතර පවත්වාගෙන යන ජංගම ගිණුමේ අදියර 1 ශේෂය වූ රු.676,085,438ක් ඊට අනුරූපී අදියර 11 හි ජංගම ගිණුමේ ශේෂය වූ රු.646,654,827 සමඟ එකග නොවුණි.

(ඇ) ව්‍යාපෘතියේ අදියර 1 හා අදියර 111 අතර පවත්වාගෙන යන ජංගම ගිණුමේ ශේෂය වූ රු.1,981,295,504 ඊට අනුරූපී අදියර 111 ජංගම ගිණුමේ ශේෂය වූ රු.1,980,769,681 සමඟ එකඟ නොවුණි.

### 2.2.3 ලැබිය යුතු ශේෂයන්

----------------------

2014 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති මිලදී ගැනුම් අත්තිකාරම් එකතුව වූ රු.696,473 ක ශේෂයක් වර්ෂයට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවති අතර, ඉන් රු.96,613 ක් වූ පෞද්ගලික අංශයේ අත්තිකාරම් වසර 5 කට වැඩි කාලයක් නිරවුල් නොවී පැවතුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අය වැය ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම මගින් මූල්‍යනය කිරීමට එකග වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දක්වා | |
| | ජපාන යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපාන යෙන් මිලියන | රු. මිලියන | ජපාන යෙන් මිලියන | රු. මිලියන |
| ණය අංකය පී - 89 | 21,917 | 24,547 | 4,642.0 | 3,481 | 3,792 | 23,499 | 25,598 |
| ණය අංකය පී - 91 | - | - | - | - | - | 11 | 12 |
| ශ්‍රී ලංකා රජය | - | 8,920 | 80.5 | 80 | 87 | - | 6,240 |
| | 21,917 | 33,467 | 4,722.5 | 3,561 | 3,879 | 23,510 | 31,850 |

ව්‍යාපෘතියේ පියවර 11 සඳහා අත්සන් කළ ණය අංක පී - 91 වෙන් කිරීම් වලින් පියවර 1 උපදේශක ගාස්තු නිරවුල් කිරීම සඳහා රු. මිලියන 12 ක් වැය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

---------------------

### 3.2.1 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් කොන්දේසි අනුව මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වෙනුවෙන් තත්ත්ව ආරක්ෂක පද්ධතියක් ක්‍රියාවේ යෙදවිය යුතු අතර ඒ සඳහා කොන්ත්‍රාත්කරු තත්ත්ව ආරක්ෂක කාර්ය මණ්ඩලයක් සැලසුම් කර සේවයේ යෙදවිය යුතුය. කෙසේ වෙතත්, එම අවශ්‍යතාවයට අනුකූල නොවූ අතර ඒ හේතුවෙන් ව්‍යාපෘති උපදේශක, තත්ත්ව ආරක්ෂණ කටයුතු සඳහා අතිරේක කාර්ය මණ්ඩලයක් යොදවා රු.මිලියන 7.22 ක් විචලන නියෝග යටතේ හිමිකම් පෑම් සිදුකර තිබුණි.තවද, 2014 දෙසැම්බර් 31 දිනට අනුකූල නොවීම් නිවේදන 81 ක් නිකුත් කර තිබුණු අතර ඉන් නිවේදන 05 ක් නිවැරදි කිරීමට 2014 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පයිල් කැප්ස්, පියර්ස් (Pile caps,Piers) හා ආධාරක වල, කොන්ක්‍රීට් උෂ්ණත්ව පාලක ක්‍රමවේදයක් පිරිවිතරයන් හා ප්‍රමාණ පත්‍රවල පද්ධති ප්‍රකාශයේ ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි ක්‍රමවේදයක් ඒවා විචලනයන් ලෙස සලකා තිබුණු අතර ඒ හේතුවෙන් අතිරේක වියදම් ලෙස රු.මිලියන 64.23 ක් විචලන නියෝගයක් යටතේ වැයකර තිබුණි.

(ඇ) තවද, දිගුකාලින ප්‍රයෝජනයට ගතහැකි පරිදි ස්ථාන ගත කිරීමේ සැලසුම් නොමැතිකම නිසා කොන්ක්‍රිට් මිශ්‍රණ යන්ත්‍රය ක්‍රියා විරහිත වී තිබුණු අතර ඒ හේතුවෙන් එකතුව රු. මිලියන 8.37 ක් ක්‍රියාවිරහිත වීම, ප්‍රවාහනය හා නැවත ස්ථාපිත කිරීම සඳහා විචලන නියෝග යටතේ ව්‍යාපෘතියට අයකොට තිබුණි.

(ඈ) 2012 අගෝස්තු අංක 2/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව සියලු ප්‍රසම්පාදන ඇස්තමේන්තු නිවැරදි බව තහවුරු වන පරිදි සියලු කරුණු සැලකීමට ගෙන මුලු ප්‍රසම්පාදන පිරිවැය තීරණය කළ යුතුය. කෙසේවෙතත්, මුල් ඇස්තමේන්තුවට රු.මිලියන 3,600 විචලන නියෝග 133ක් ඇතුළත් කර තිබුණු අතර රු. මිලියන 22.95 ක් වටිනා විචලන නියෝග ඉන් ඉවත් කර තිබුණි. මෙම තත්ත්වය ව්‍යාපෘතියේ කටයුතු වලට ගැටළුකාරී තත්ත්වයක් හා අවාසිදායක බලපෑම් ඇතිවීමට ඉඩ තිබුණි. තවද, එම විෂය පථ වෙනස් වීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඉ) අධිවේග මාර්ගයේ අභ්‍යන්තර හුවමාරු ස්ථාන හඳුන්වා දීම නිසා ව්‍යාපෘති විෂය පථය වෙනස් වී මුළු කොන්ත්‍රාත්තු පිරිවැය 20% කින් වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

I. අතුරුගිරිය හා කොතලාවල අන්තර් හුවමාරු ස්ථාන අධිවේග මාර්ගයේ මුල් නිර්මාණ සැලසුම් වල ඇතුළත්ව නොතිබුණු අතර ව්‍යාපෘති අදියර 1 යටතේ ඇස්තමේන්තු පිරිවැය පිළිවෙලින් රු.මිලියන 2,078 ක් හා රු.මිලියන 475.68 ක් වෙන වෙනම කොන්ත්‍රාත්තු

වශයෙන් එකම කොන්ත්‍රාත්කරුට පිරිනමා ඒවා ඉදිකර තිබුණි. කෙසේවෙතත් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර රේඛිය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයද ලබාගෙන නොතිබුණි.

II. තවද, කොන්ත්‍රාතු කොන්දේසි වගන්ති 59.1 ප්‍රකාරව අතුරුගිරිය අන්තර් හුවමාරු මගී වේදිකාව ඉදිකිරීම හා තාර මිශ්‍රන ඇතිරීමට කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර ඒවා මුල් අදියරේදී ඇස්තමේන්තු ගත කර නොතිබුණි. අදාල වැඩ උප කොන්ත්‍රාත්කරුවකු ලවා කරගෙන තිබු අතර රු.මිලියන 15.81ක් විචලන නියෝග යටතේ ඒ සඳහා වියදම් දරා තිබුණි.

III. කොතලාවල අන්තර් හුවමාරු ඉදිකිරීම් වැඩ අදියර 11 යටතේ සැලසුම් කර තිබුණි.කෙසේ වෙතත්, ස්ථිර අන්තර් හුවමාරුවක් ඉදිකිරීම ප්‍රමාද වන නිසා රු.මිලියන 176.74 ක පිරිවැයක් දරමින් තාවකාලික අන්තර් හුවමාරු ස්ථානයක් ඉදිකොට අදියර 1ට අය කර තිබුණි. පසුව විචලන නියෝග යටතේ තාවතාලික අන්තර් හුවමාරුව රු.මිලියන 10.10 ක පිරිවැයක් දරමින් කඩා ඉවත් කොට ස්ථිර අන්තර් හුවමාරුවක් රු.මිලියන 481.60 ක පිරිවැයක් දරමින් ඉදිකොට තිබුණි.

IV. දකුණු අධිවේගී මාර්ගයේ ක්‍රියාකාරකම් ආරම්භ කිරිමට පෙර කොට්ටාව අන්තර් හුවමාරු නිම කිරිමට සැලසුම් කර තිබුණි.කෙසේවෙතත්,ස්ථිර හුවමාරු ස්ථානයක් ඉදි කිරීම ප්‍රමාද වන නිසා ව්‍යාපෘති අදියර I යටතේ තාවකාලික හුවමාරු ස්ථානයක් රු.මිලියන 258.92 ක පිරිවැයකට විචලා‍ය නියෝග යටතේ ඉදි කර තිබුණි. කෙසේවෙතත් තාවකාලික අන්තර් හුවමාරුව රු.මිලියන 8.27 ක් වැය කර කඩා ඉවත් කර අලුත් ස්ථිර අන්තර් හුවමාරුක් රු. මිලියන 945.33 ක පිරිවැයකට ඉදි කර තිබුණි. ස්ථිර අන්තර් හුවමාරුවක් ඉදි කිරීම මාස 36 ක ප්‍රමාදයක් වු අතර ප්‍රමාද දඩ වශයෙන් රු.මිලියන 16.91 ක් අය කර ගෙන නොතිබුණි.

(ඊ) කොන්ත්‍රාත් කොන්දේසි වගන්ති 62.2 අනුව රු.මිලියන 200 ඉක්මවන අතුරු ගෙවීම් සහතික තාක්ෂණික ඇගයිම් කමිටුව විසින් සලකා බැලිය යුතුය. කෙසේ වෙතත් රු.මිලියන 200 ඉක්මනොවන අතුරු ගෙවීම් සහතික 10 ක් , 2014 දෙසැම්බර් 31 දක්වා ඇගයීම් කර තිබුණි.

(උ) අතුරුගිරිය අන්තර් හුවමාරුවේ ඉදිකිරීම් කටයුතු ආවරණය කිරීම සඳහා උපදේශක කොන්ත්‍රාත්තුවේ කාලය 2014 අගෝස්තු සිට 2015 අප්‍රේල් දක්වා දීර්ඝ කර තිබුණ අතර ඒ සඳහා රු. මිලියන 77.12 ක් විචලන නියෝග යටතේ ගෙවා තිබුණු අතර ඒ සඳහා අදාල පාර්ශවවල අනුමැතිය ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.3.** **ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කරගැනීම් සහ නැවත පදිංචි කිරීමේ කටයුතු**

---

මූල්‍ය ප්‍රකාශනවලට අනුව ව්‍යාපෘති කටයුතු හේතු කොටගෙන අවතැන්වන පුද්ගලයන් යළි පදිංචි කරවීම සඳහා අක්කර 6.2 ක ප්‍රමාණයකින් යුත් ඉඩම් 06 ක් අත්පත් කර ගැනීම සඳහා 2014 දෙසැම්බර් 31 වන දින දක්වා රු. මිලියන 2,719.6 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ඉඩම් අත්පත්කර ගැනීමේ හා නැවත පදිංචි කිරීමේ කටයුතු 2011 දෙසැම්බර් අවසානයට නිමකිරීමට අපේක්ෂා කර තිබූ බව නිරීක්ෂණය විය.කෙසේවෙතත් අධිවේගී මාර්ගයේ අදියර 1 ඉඩම් අත්කර ගැනීමේ කටයුතු 99% ක් 2014 දෙසැම්බර් 31 දිනට නිමකර තිබූ අතර, නැවත පදිංචි කිරීමේ කටයුතු 86% පමණක් එදිනට නිමකර තිබුණි.

(ආ) 2009 වර්ෂයේ කඩුවෙල ප්‍රදේශයේ ඉඩම් පර්චස් 324.17 ක ප්‍රමාණයක් රු. මිලියන 71.82 පිරිවැයකට අවතැන්වූවන් නැවත පදිංචි කිරිම සඳහා අත්පත් කර ගෙන තිබුණි.පසුව ඉඩම් සංවර්ධන කටයුතු සඳහා රු.මිලියන 23.92 ක් වැය කර තිබුණි.අත්පත් කරගත් ඉඩම් කැබලි 21කට මායිම වෙන් කර තිබු අතර ඉන් කැබලි 08 ක් අවතැන්වූවන්ට භාරදීමට ක්‍රියා නොකර 2014 දෙසැම්බර් 31 දිනට නිෂ්ක්‍රීයව තිබුණි.

**3.4** **<u>මතභේදයට තුඩු දෙන කරුණු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් කොන්දේසි වලින් ආවරණය නොවූ රු. මිලියන 1000 ක අතිරේක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර එය අතුරු ගෙවීම් සහතික මගින් නිරවුල් කර නොතිබුණි. කෙසේවෙතත්, කොන්ත්රාතුව අවසාන කාලයේදි ඉන් රු. මිලියන 587.05 ක් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් වලින් ආපසු අයකර ගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය නිසා බැඳීම් ගාස්තු ලෙස ණය මුදලේ වියපැහැදම් නොවූ ශේෂය පදනම් කොට ගෙන රු.මිලියන 750.39 ක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි ගෙවීම් ප්‍රමාදය නිසා රු.මිලියන 76.60 ක් පොළි ලෙස 2014 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි.

(ඈ) භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නිකුත් කළ 2003 ජුනි 02 දිනැති අංක පිර්ඩි/12 චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව පොදු කාර්ය වියදම් ලෙස රු.මිලියන 141.74 ක් 2014 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.